**ඉඩම් මැනුම් සභාව**

**நில அளவைச்சபை**

**Land Survey Council**

# 2014

# වාර්ෂික වාර්තාව

**ஆண்டறிக்கை**

# ANNUAL REPORT

ඉඩම් අමාත්‍යාංශය

காணி அமைச்சு

Ministry of Lands

# <u>පටුන</u>


| | | |
|---|---|---|
| 1. | සභාපතිගේ පණිවුඩය | 01 |
| 2. | දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය | 02 |
| 3. | ඉඩම් මැනුම් සභාවේ කාර්ය භාරයන් | 03 |
| 4. | ඉඩම් මැනුම් සභාවේ බලතල | 04 |
| 5. | ඉඩම් මැනුම් සභාවේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාව | 05 |
| 6. | ඉඩම් මැනුම් සභාවේ කාර්ය මණ්ඩලය | 06 |
| 7. | කාර්යයන් | 06 |
| 8. | අධ්‍යායපන සහ පුහුණු | 08 |
| 9. | මූල්‍යය මෙහෙයුම් සමාලෝචනය | 10 |
| 10. | අරමුදල් සහ මූල්‍යම කළමනාකරණය | 10 |
| 11. | 2014 වර්ෂය සඳහා වූ අවසන් ගිණුම් | 11 |
| | i මූල්‍යූ තත්වය පිළිබඳ ප්‍රලකාශනය | 12 |
| | ii මූල්‍ය0 කාර්ය සාධනය | 13 |
| | iii ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රවකාශය | 14 |
| | iv මුදල් ප්‍රෙවාහ ප්‍රයකාශය | 15 |
| | v 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්වලට අදාල සටහන් | 16 |
| | vi 2014-12-31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා පොදු ගිණුම් ප්‍රසතිපත්ති | 19 |
| 12. | විගණකාධිපති වාර්තාව | 20 |

# 01 සභාපතිගේ පණිවුඩය

ඉඩම් මැනුම් සභාව,
අංක 150, කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

2015 ජූනි මස 01 වන දින

තරඟකාරි ගෝලීය වෙළඳපොළ තුල ගුණාත්මක මෙන්ම වෘත්තිය නිපුනත්වයෙන් යුත් මැනුම් සේවාවන් වෙත නාභිගත වී වෘත්තිය පරිසරය ශක්තිමත් කිරිමේ අරමුණින් යුක්තව 201 4 වසර තුලදීද ඉඩම් මැනුම් සභාව ක්‍රියාත්මක කර ඇති අතර සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ඉඩම් මැනුම් සභාව විසින් ඉටු කරන ලද කාර්ය භාරය පිළිබඳව මම සෑහීමකට පත්වෙමි.

2002 අංක 17 දරණ මැනුම් පනතෙහි විධිවිධාන පරිදි පිහිටුවා ඇති ඉඩම් මැනුම් සභාවේ ප්‍රමධාන කාර්ය භාරයන් වනුයේ, මිනින්දෝරුවරුන් ලියාපදිංචි කිරීම, ලියාපදිංචි මිනින්දෝරුවරුන් සඳහා වාර්ෂික වෘත්තියේ යෙදීමේ බලපත්රව නිකුත් කිරීම, මහජනතාව සඳහා මිනින්දෝරුවරුන්ගේ තොරතුරු ලබාදීම, මිනින්දෝරුවරුන්ගේ වෘත්තීමය විනය පවත්වාගෙන යාම, මිනින්දෝරුවරුන්ට එරෙහිව මහජනතාවරගෙන් ඉඩම් මැනුම් සභාවට ලැබෙන පැමිණිලි විභාග කිරීම, මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පැවැත්වීම සහ අදාල ආයතන සමග සම්බන්ධීකරණයක් පවත්වාගෙන යෑම වේ.

ඉඩම් මැනුම් සභාව 201 4 වර්ෂය සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් 1070 දෙනෙකුට පුද්ගලික මැනුම් කටයුතුවල යෙදීම සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර ලබා දෙන ලදී. තවද ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ට එරෙහිව සාමාන්‍ය ජනතාව මෙන්ම නොයෙකුත් ආයතන විසින් සභාව වෙත ඉදිරිපත් කරන ල ද වෘත්තීය විෂමාචාරයන් පිළිබඳව පැමිණිලි 80 ක් සම්බන්ධයෙන් 2014 වසර තුලදී සභාව විසින් පරීක්ෂණ පවත්වා අවසන් කර ඇත.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ලියාපදිංචි මිනින්දෝරුවරුන් අතරේ වෘත්තිමය විනය පවත්වා ගෙන යාම සහ ඔවුන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය පිළිබඳව ඉඩම් මැනුම් සභාව බලවත් උනන්දුවක් දැක්වූ අතර ඉඩම් මැනුම් ක්ෂේත්‍රයට සම්බන්ධ වෘත්තීය සංවර්ධන පාඨමාලා 09 ක් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් සඳහා ඉඩම් මැනුම් සභාවේ සහභාගිත්වය සහ අනුමැතිය ඇතිව පවත්වන ලදී. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විසින් අඛන්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා හැදැරිමට දැක්වූ දැඩි උනන්දුව කැපී පෙනුනු කරුණක් විය.

තවද, මැනුම් පනතෙහි 39 වන වගන්තියෙහි විධිවිධාන පරිදි ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය බලාපොරොත්තුවන තැනැත්තන් ලියාපදිංචි කිරීම පිළිබඳව ක්‍රියා පටිපාටිය සහ මැනුම් පනතෙහි 02 වන වගන්තියෙහි විධිවිධාන පරිදි සර්වේයර් ජනරාල් විසින් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් සඳහා පිලියෙල කරගෙන යනු ලබන තාක්ෂණික සංග්‍රහය ඉඩම් මැනුම් සභාව විසින් 2015 වසර තුලදී ප්‍රකාශයට පත් කිරීමට බලාපොරොත්තු වේ.

සමාලෝචිත කාලය තුල ඉඩම් මැනුම් සභාවේ කාර්යයන් පහසුවෙන් කරගෙන යාමට නොමසුරු ව සහයෝගය දැක්වූ ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින්, වැඩ බලන ලේකම් , ගණකාධිකාරී (අර්ධකාලීන) හා කාර්ය මණ්ඩලය වෙත මගේ ස්තූතිය පුදකර සිටිමි.

පී. එම්. පී. උදයකාන්ත
සභාපති

# 02 දැක්ම හා මෙහෙවර

## දැක්ම

ඉඩම් මැනුම් සඳහා ක්රෙමවත්රාමුවක අඛන්ඩතාව පවත්වා ගනිමින් ජාතික සංවර්ධනය උදෙසා අපගේ භෞතික හා ස්වභාවික සම්පත් වල ප්ර්ශස්ත හා තිරසාර උපයෝගිතාව තහවුරු කර ඒ තුළින් තරඟකාරි ගෝලීය වෙළඳපොළ තුල ගුණාත්මක මෙන්ම වෘත්තිය නිපුනත්වයෙන් යුත් මැනුම් සේවාවන් වෙත නාභිගත වි වෘත්තිය පරිසරය ශක්තිමත් කිරිම අපගේ දැක්ම වේ.

## මෙහෙවර

මැනුම් වෘත්තිය හා එහි ව්යනවහාරයන් ක්රනමවත්ව පවත්වාගන්නා බවටත් වෘත්තියෙන් බලාපොරොත්තු වන්නාවූ තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්මිතීන් වලට එකඟ වන ලෙස පුහුණුවක් හා අධ්යාාපනයක් වෘත්තීයට ප්රාවේශවන්නන්වත ලැබෙන බවටත් එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්රනමිතීන් පවත්වාගනු ලබන බව තහවුරු කිරිම ඉඩම් මැනුම් සභාවේ මෙහෙවර වේ.

## 03 2002 අංක 17 දරණ මැනුම් පනතේ විධිවිධාන පරිදි ඉඩම් මැනුම් සභා වේ කාර්ය භාරයන්

2002 අංක 17 දර ණ මැනුම් පනතේ විධිවිධාන පරිදි ඉඩම් මැනුම් සභාව 200 3 වර්ෂයේදි පිහිටුවනු ලැබූ අතර එහි මෙහෙයුම් කටයුතු කොළඹ 05, කිරුළ පාරේ, අංක 150 දර ණ ස්ථානයේ පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාලයේ පළමු මහලේදි ආරම්භ කරන ලදී.

උක්ත පනතේ 37 වන වගන්තියේ දක්වා ඇති පරිදි සභාවේ කාර්යයන් පහත පරිදි වේ.

(අ) ඉඩම් මැනීමට අදාළ ප්‍රමිති හා කාර්ය පටිපාටිය පවත්වා ගෙන යාම හා ඉඩම් මැනිමේ කටයුතුවල යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තියමය විනය පවත්වාගෙන යාම;

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරිම සඳහා මිනින්දෝරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර භාරගැනීම සහ ඒ මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනිමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම් සහ පළපුරුද්ද සහ හැකියාව සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවන්හිදි ඔවුන් ලියාපදිංචි කිරිම;

(ඇ) වාර්ෂික වෘත්තියමය බලපත්‍රය නිකුත් කිරිම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත් භාර ගැනිම සහ එවැනි මිනින්දෝරුවන්ට ඉඩම් මැනිමේ වෘත්තිය කරගෙනයාම සඳහා දැනුම සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහිමකට පත්වන අවස්ථාවන්හිදී එවැනි බලපත්‍ර නිකුත් කිරිම;

(ඈ) ඉඩම් මැනිමේ යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තියමය අධ්‍යාපනය පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කිරිම;

(ඉ) මිනින්දෝරු වෘත්තියේ යෙදී සිටින හා වාර්ෂික වෘත්තියමය බලපත්‍රප ලබාගැනිමට නියම කරන ලද තැනැත්තන්ගේ දැනුම හා දක්ෂතා වැඩිදියුණු කිරිමේ කාර්ය සඳහා වෘත්තියමය සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරිම;

(ඊ) ඉඩම් මැනිම පිළිබඳ ශාස්ත්‍රීය හා වෘත්තියමය සුදුසුකම් පිළිගැනිම, ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා නියම කිරිම සහ ලියාපදිංචි මිනින්දෝරුවන් ලෙස ලියාපදිංචි වීමට සහ වාර්ෂික වෘත්තිමය බලපත්‍ර නිකුත් කිරිම සඳහා වූ අපේක්ෂකයන් වෙනුවෙන් සුදුසුකම් ලැබිමේ විභාග හා වෘත්තියමය සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම;

(උ) ඉඩම් මැනිමෙහි යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනිම යන කරුණු වලදී සම තත්වයක් හා අන්‍යෝන්‍යතාවක් ස්ථාපිත කිරිම සඳහා විදේශීය රටවල බලධරයන් සමග අන්‍යෝන්‍යය වැඩ පිළිවෙලවල් සඳහා එකඟතාවය ඇතිකර ගැනිම හා ක්‍රියාත්මක කිරිම;

(ඌ) නියම කරන ලද අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් මැනුම් කටයුතු හා ඉඩම් තොරතුරු පිළිබඳව නියැලි සිටින ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරිම;

(එ) උසස් වෘත්තියමය ප්‍රමිතීන් පවත්වාගෙන යාමේදී ශ්‍රී ලංකාවේ වෙනත් අදාළ සංවිධාන සමග සම්බන්ධීකරණය කිරිම;

## 04 ඉඩම් මැනුම් සභාවේ බලතල

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනිම, දැරීම, බද්දට ගැනිම හෝ බද්දට දීම, උකස් කිරිම, ඔඩපනය කිරිම, විකිණිම හෝ අන්‍යාරකාරයකින් බැහැර කිරිම

(ආ) මුදලින් හෝ අන්‍යාණකාරයේ වූ ත්‍යාාග ප්රරදාන හෝ පරිත්‍යාැග භාර ගැනිමට සහ ස්වකීය කටයුතු කිරිම සඳහා ඒවා යොදා ගැනිම.

(ඇ) සභාවේ කටයුතු කරගෙන යාමට අව ශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරිම.

(ඈ) එසේ පත්කරන ලද නිලධරයන් ට හා සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍ර්මිකය තීරණය කිරිම

(ඉ) ස්වකීය කර්තව්‍යනයන් ඵලදායි ලෙස ඉටුකිරිම සඳහා කමිටු පත් කිරිම .

(ඊ) ස්වකීය නිලධරයන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්ර මයක් පිහිටුවීම හා සුභසාධන හා ක්රීඩා පහසුකම් සැපයීම

(උ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් නීති සෑදීම.

(ඌ) සාමාන්‍යුයෙන් සභාවේ කර්තව්‍යජ නිසිපරිදි ඉටුකිරිම පහසු කරලීම සඳහා අවශ්‍යරවන වෙනත් සියලු දේ කිරිම.

## **05** 2014 වසර තුළ ඉඩම් මැනුම් සභාවේ කාර්යසාධනය පිළිබඳ වාර්තාව

<u>2014 දෙසැම්බර් 31 වන දිනට සිටි ඉඩම් මැනුම් සභා සාමාජිකයන්:</u>

i. පී. එම්. පී. උදයකාන්ත මයා - සභාපති
ii. එස්. එම්. පී. පී. සංසක්කාර මයා - උප සභාපති
iii. එස්. ඩී. පී. ජේ. දාම්පෙගම මයා - සාමාජික
iv. ආචාර්ය කේ. ආර්. එම්. යූ. බණ්ඩාර මයා - සාමාජික
v. සී. ද එස්. ගුණතිලක මයා - සාමාජික
vi. කේ. ඒ. එම්. ද අල්විස් මයා - සාමාජික
vii. ඩී. ඩී. වයි. අබේවර්ධන මයා - සාමාජික

<u>සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය සඳහා වූ ඉඩම් මැනුම් සභා සාමාජිකයන්:</u>

i ආචාර්ය කේ.තවලිංගම් මයා (සභාපති) - 2013-07-25 සිට 2014-03-05 දක්වා
ii නිහාල් ගුණවර්ධන මයා (සභාපති) - 2014-03-06 සිට 2014-05-28 දක්වා
iii පී. එම්. පී. උදයකාන්ත මයා (සභාපති) - 2014-05-29 සිට සමාලෝචිත කාලය තුළ
iv නිහාල් ගුණවර්ධන මයා (උප සභාපති) - 2013-07-25 සිට 2014-03-05 දක්වා
v පී. එම්. පී. උදයකාන්ත මයා (උප සභාපති) - 2014-03-06 සිට 2014-05-28 දක්වා
vi එස්. එම්. පී. පී. සංගක්කාර මයා (උප සභාපති) - 2014-05-29 සිට සමාලෝචිත කාලය තුළ
vii එස්. ඩී. පී. ජේ. දාම්පෙගම මයා (සාමාජික) - 2013-07-25 සිට සමාලෝචිත කාලය තුළ
viii ආචාර්ය කේ. ආර්. එම්. යූ. බණ්ඩාර මයා (සාමාජික) - 2012-01-01 සිට සමාලෝචිත කාලය තුළ
ix සී. ද එස්. ගුණතිලක මයා (සාමාජික) - 2012-01-01 සිට සමාලෝචිත කාලය තුළ
x කේ. ඒ. එම්. ද අල්විස් මයා (සාමාජික) - 2012-01-01 සිට සමාලෝචිත කාලය තුළ
xi ඩී. ඩී. වයි. අබේවර්ධන මයා (සාමාජික) - 2013-10-25 සිට සමාලෝචිත කාලය තුළ

<u>මැනුම් සභා රැස්වීම් වාර සඳහා සහභාගීත්වය:</u>

i. ආචාර්ය කේ.තවලිංගම් මයා - සභාපති - රැස්වීම් වාර 03
ii. නිහාල් ගුණවර්ධන මයා - සභාපති - රැස්වීම් වාර 02
iii. පී. එම්. පී. උදයකාන්ත මයා - සභාපති - රැස්වීම් වාර 15
iv. නිහාල් ගුණවර්ධන මයා - උප සභාපති - රැස්වීම් වාර 03
v. පී. එම්. පී. උදයකාන්ත මයා - උප සභාපති - රැස්වීම් වාර 02
vi. එස්. එම්. පී. පී. සංසක්කාර මයා - උප සභාපති - රැස්වීම් වාර 15
vii. එස්. ඩී. පී. ජේ. දාම්පෙගම මයා - සාමාජික - රැස්වීම් වාර 14
viii. ආචාර්ය කේ. ආර්. එම්. යූ. බණ්ඩාර මයා - සාමාජික - රැස්වීම් වාර 18
ix. සී. ද එස්. ගුණතිලක මයා - සාමාජික - රැස්වීම් වාර 20
x. කේ. ඒ. එම්. ද අල්විස් මයා - සාමාජික - රැස්වීම් වාර 20
xi. ඩී. ඩී. වයි. අබේවර්ධන මයා - සාමාජික - රැස්වීම් වාර 18
xii. තිමාලි ද සිල්වා මෙනවිය - භාණ්ඩාගාර නියෝජිත - රැස්වීම් වාර 09 (නිරීක්ෂකයකු ලෙස)

## 06 ඉඩම් මැනුම් සභා කාර්ය මණ්ඩලය:

| | | |
|---|---|---|
| i | ජී.ඩී.එස්.කේ.ගුණරත්න මයා - ලේකම් (වැඩ බැලීමේ පදනම මත) | - 2009-01-01 සිට මේ දක්වා |
| ii | රංජිත් මහකුඹුර මයා - ගණකාධිකාරි (අර්ධ කාලීන පදනම මත) | - 2008-03-01 සිට මේ දක්වා |
| iii | ඩබ්.ඒ.එස්.ප්‍රි යදර්ශනී මෙනවිය පරිගණක යෙදවුම් සහකාර සහ ලිපිකරු | - 2004-05-24 සිට මේ දක්වා |
| iv | ආර්. එම්. එන්. රත්නායක මිය පරිගණක යෙදවුම් සහකාර සහ ලිපිකරු | - 2013-03-18 සිට මේ දක්වා |
| v | ටී.ජී.ප්‍ර නාන්දුමයා - කාර්යාල කාර්ය සහායක | - 2004-07-15 සිට මේ දක්වා |

## 07 කාර්යයන්


**ලියාපදිංචිය:**

සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ මිනින්දෝරුව රුන් 55 දෙනෙකු අලුතින් ලියාපදිංචි වී ඇති අතර 2014-12-31 වන දිනට ලියාපදිංචි වු මුළු මිනින්දෝරුව රුන්ගේ ගණන 2030 කි. මෙම මිනින්දෝරුව රුන් සඳහා ලියාපදිංචි සහතික ලබා දී ඇත.

**වාර්ෂික වෘත්තියේ යෙදීමේ බලපත්‍රය:**

වාර්ෂික බලපත්‍රය ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ සංඛ්‍යාතව සමාලෝචිත කාල පරිච්ජේදයේදී 1070 කි. 2014 වර්ෂයේදී ලබාදුන් බලපත්‍ර සංඛ්‍යාව 2013 වර්ෂයට සාපේක්ෂ7ව සුළු අඩුවීමක් සිදුවී ඇත.

**2013/2014 වසර තුළ නිකුත් කරනු ලැබු මුළු බලපත්‍රන සංඛ්‍යාව**




2014 ජනවාරි මස 31 වන දින වනවිට වාර්ෂික මැනුම් බලපත්‍ර1 ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ මුලකුරු සමග නම්, ලියාපදිංචි අංක සහ ජාතික හැඳුනුම්පත් අංක සමග 2014 මාර්තු 28 දින පල වු අංක 1856 දරණ ගැසට් පත්‍රයේ විධිමත් ලෙස ප්‍රදසිද්ධියට පත් කරනු ලැබීය.


සියලුම බලයලත් මිනින්දෝරුවරුන්ගේ විස්තර - ලියාපදිංචි අංක, මුලකුරු සමග නම, ජාතික හැඳුනුම්පත් අංක, දිස්ත්‍රික්කයේ නම, ලිපිනයන්, දුරකථන අංකවාර්ෂික බලපත්‍රයේ අංකය, බලපත්‍රයේවලංගු කාලය ඇතුළත් තොරතුරු www.survey.gov.lk යන වෙබ් අඩවියට ද ඇතුළත් කරනු ලැබ ඇත. එහි සඳහන් තොරතුරු සෑම මාස තුනකට වරක් යාවත්කාලීන කෙරේ.

## මහජනතාව සඳහා තොරතුරු

මහජනතාව, ඉඩම් මැනුම් සභාව විසින් සපයන සේවාවන් පිළිබඳව දැනුවත් වී සිටින බැවින් බලයලත් මිනින්දෝරුවරුන් විසින් වසර සියයක ට පමන පෙර සිට සකසන ලද මුල් මැනුම් පිඹු රුවල පිටපත් ලබා ගැනිම සඳහා බලයලත් මිනින්දෝරුව රුන් ජීවත්ව සිටිනවාද, මියගොස්ද යන තොරතුරු ලබාගැනීමට නිතරම සහය පතයි. එවැනි තොරතුරු අප්‍රනමාණසපයීමේ අදහස ඇතිව බලයලත් මිනින්දෝරුව රුන්ගේ අදාල පුද්ගලික ලිපිනයන්, ලියාපදිංචි අංක හා බලපත්‍රස අංකයින් තොරතුරු අන්තර්ගත කිරිම සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සම්පූර්ණ කර ඇත. බලයලත් මිනින්දෝරුව රුන් පිළියෙල කළ මුල් පිඹුරු පිටපත් ලබාගැනිමට උදව් විය හැකි පුද්ගලයින් සමග සම්බන්ධවීමට මහජනතාවට ප්‍ර වේශ වියහැකි හැකිවන පරිදි ඔවුන්ගේ දුරකථන අංකද ඇතුලත්කර මෙය යාවත්කාලීන කර නු ලැබේ. එසේ වුවත්, මේ වනතුරු පිඹුරු ක්‍රිමානුකූලව ඔවුන්ට ලබා ගැනිමටපූර්ණ වශයෙන්ම සහාය වීමට නොහැකිවීම නිසා මෙම සේවාවන් පිළිබඳව ඉඩම් මැනුම් සභාව සෑහීමකට පත් නොවේ. ස මාලෝචිත කාල පරිච්ඡේදය තුළ එවැනි විමසීම් 322 ක් සිදුකර තිබේ.

## ඉඩම් මැනුම් සභාවට මහජනතාවගෙන් ලැබී ඇති පැමිණිලි:

**නිරාකරණය කරන ලද මුළු පැමිණිලි සංඛ්‍යාගව**




2013 වස රේදී පැමිණිලි 24 ක් නොවිසඳා ඉදිරිවූ අතර වෘත්තීය විෂමාචාරයේ යෙදී ඇති බවට චෝදනා ලබා ඇති බලයලත් මිනින්දෝරුව රුන් සම්බන්ධව පැමිණිලි 82 ක් 2014 වසර තුළදී මහජනයාගෙන් ලැබී තිබිණි. ඉඩම් මැනුම් සභාවේ තීරණය පරිදි සමාලෝචිත වසර තුළදී මූලික විමර්ශන 39 ක් සහ විධිමත් පරීක්ෂලණ 41 ක් සිදු කරනු ලැබීය. 2014 වසර තුළදී, එවැනි පැමිණිලි 82 ක කාර්යයන් අවසන් කළ හැකි වූ අතර වසර අවසාන වන විට පැමිණිලි 24 ක් පමණක් නොවිසඳී පැවතුණි.

කෙසේ වුවත්, සමහර පැමිණිලි 2002 අංක 17 දරන මැනුම් පනතේ විධිවිධාන අනුව ඉඩම් මැනුම් සභාවේ විෂය පථයට නොගැනෙන බැවින් ද, සමහර පැමිණිලි අධිකරණයේ නියෝග මත ගරු අධිකරණයේ ලියාපදිංචි

උසාවි කොමසාරිස්වරයෙකු වශයෙන් කරන ලද මැනීම් සම්බන්ධයෙන් බැවින්ද, සමහර පැමිණිලි ගරු අධිකරණයේ විභාග කරමින් පවතින නඩුවක් සම්බන්ධයෙන් බැවින්ද, සමහර පැමිණිලි සනාථ කිරීමට ප්‍රකමාණවත් සාක්ෂින නොතිබූ බැවින්ද, එම පැමිණිලි සම්බන්ධයෙන් පැමිණිලිකරුවන්ට සහනයක් සැලසීමට ඉඩම් මැනුම් සභාවට නොහැකි විය.

2002 අංක 17 මැනුම් පනතේ විධිවිධාන පරිදි 2014 වර්ෂයේදී සිදු කරන ලද පරික්ෂටණවල තීරණයන්ට අනුව පහත සටහනේ දැක්වෙන පරිදි මිනින්දෝරුවරුන්ගේ බලපත්‍ර2ය අත්හිටුවීම හෝ ලියාපදිංචිය අවලංගු කිරීම සිදු කරන ලදී.

| ගොනුව | ලියාපදිංචි අංකය | ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයාගේ සම්පූර්ණ නම | විධිමත් පරීක්ෂමණයේ තීරණය |
|---|---|---|---|
| LSC/5/616 | 19930095 | බතිගම බඩල්ගේ ප්‍රේෂමතිලක | 2014-06-01 සිට 2014-08-30 දක්වා බලපත්‍රබය අත්හිටුවන ලදී |
| LSC/5/299 | 19710708 | හික්කඩුව විතාණගේ අමරපාල ද සිල්වා | 2014-08-14 සිට 2015-08-13 දක්වා බලපත්‍රුය අත්හිටුවන ලදී |
| LSC/5/597 | 20040849 | සත්තම්බිරල්ලාගේ දොන් ජෝෂප් ගාමිණී දයා අර්සකුලරත්න | 2014-08-14 සිට ලියාපදිංචිය අවලංගුකරන ලදී. |
| LSC/5/633 | 19901048 | ජෝසප් රොහාන්ත අජිත් ද ජැකලින් සෙනෙවිරත්න | 2014-10-01 සිට 2014-12-31 දක්වා බලපත්‍රරය අත්හිටුවන ලදී |
| LSC/5/692 | 19910791 | හුනුවල පොල්වත්තගේ සරත් රාජපක්ෂව | 2015-01-01 සිට 2015-03-31 දක්වා බලපත්‍ර ය අත්හිටුවන ලදී |
| LSC/5/693 | 19650105 | දොන් ඩේවිඩ් ක්ලැරන්ස් හීන්දෙණිය | 2015-01-01 සිට 2015-06-30 දක්වා බලපත්‍රේය අත්හිටුවන ලදී |

## 08 අධ්‍යායපන හා පුහුණු

**අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා**

අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය ඉඩම් මැනිමේ ප්‍ර0ධාන අංගයකි. ඉඩම් මැනුම් සභාව මේ පිළිබඳව දැනුවත්ව සිටින බැවින් මැනුම් වෘත්තිකයින් විසින් ඉඩම් මැනුම් ක්ෂේත්‍රියට හඳුන්වාදුන් නව තාක්ෂණයේ වර්තමාන සංවර්ධනයට අනුරූපවන්නාවූ පුහුණු පාඨමාලා හැදැරීමට ලියාපදිංචි බලයලත් මිනින්දෝරුව රුන් ධෛර්යමත් කර ඇත.

**ශ්‍රීය ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ශ්‍රීප ලංකා මිනින්දෝරුවරුන්ගේ ආයතනය සහ දිස්ත්‍රිකක් බලයලත් මිනින්දෝරු සංගම් මගින් පවත්වනු ලැබූ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා (CPD)**

ඉඩම් මැනුම් සභාවේ මග පෙන්වීම යට තේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය ලබාගැනීමේ අදහස ඇතිව ලියාපදිංචි මිනින්දෝරුවරුන්ට සහ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ට අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පැවැත්වීමට බලවත් උනන්දුවක් දැක්වූ ශ්‍රීය ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ශ්‍රීා ලංකා මිනින්දෝරුවරුන්ගේ ආයතනය සහ දිස්ත්‍රිවක් බලයලත් මිනින්දෝරු සංගම් (ගම්පහ, බදුල්ල සහ මහනුවර) යන ආයතන පිළිබඳව ඉඩම් මැනුම් සභාව සතුටින් සඳහන් කරයි.

**මුල්වරට බලපත්‍ර ලබාගත් මිනින්දෝරුවන් සඳහා වූ වැඩමුළුව (අභිමුඛ වැඩමුළුව)**


තම ජීවිත ගමන වෘත්තීය මිනින්දෝරුවරයකු ලෙස ආරම්භ කිරීම සඳහා ප්‍රථම වතාවට ඉඩම් මැනුම් සභාවෙන් වාර්ෂික වෘත්තියේ යෙදීමේ බලපත්‍රය ලබාගෙන සිටින මිනින්දෝරුවරුන් ගේ ප්‍රයෝජනය සඳහා පෙරවර්ෂවලදී මෙන්ම අභිමුඛ වැඩමුළුවක් පවත්වනු ලැබිය. පුළුල් අත්දැකීම් සහිත, විශිෂ්ඨ හැකියාවන්ගෙන් යුත් ප්‍රනකට ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවන්වූ සම්පත්දායකයින් එකී ලියාපදිංචි මිනින්දෝරුවරුන් දැනුවත් කිරීම සඳහා තෝරාගනු ලැබිය.

**පැවැත්වූ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පිළිබඳ සාරාංශය**

| | ආයතනයේ නම | අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලාවේ නම් | පාඨමාලාව පැවැත්වූ දිනය |
|---|---|---|---|
| 1 | ඉඩම් මැනුම් සභාව | අභිමුඛ වැඩමුළුව<br>(Orientation Workshop) | 2014-03-07 |
| 2 | බදුල්ල දිස්ත්‍රික් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගමය | ඉඩම් තක්සේරුකරණය<br>(Land Valuation) | 2014-03-22 |
| 3 | ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව | ප්‍රතීතන සහතිකය නිකුත් කිරීම සඳහා වූ වැඩමුළුව<br>(Workshop for issuing Acreditation Certificate) | 2014-04-28 |
| 4 | ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය | දේපල තක්සේරුකරණය<br>(Property Valuation) | 2014-06-11 |
| 5 | ගම්පහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගම | බිම්සවිය වැඩසටහන<br>(Bimsaviya Programme) | 2014-06-24 |
| 6 | ඉඩම් මැනුම් සභාව | තාක්ෂණික වැඩමුළුව I<br>(Technical Session I) | 2014-06-27 |
| 7 | ගම්පහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | ඉඩම් නීතිය<br>(Land Law) | 2014-08-24 |
| 8 | මහනුවර බලයලත් මිනින්දෝරු සංගමය | ගෝලීය පිහිටුම් පද්ධතිය<br>[Global Positioning Systems (GPS)] | 2014-08-31 |
| 9 | ඉඩම් මැනුම් සභාව | තාක්ෂණික වැඩමුළුව II<br>(Technical Session II) | 2014-09-12 |

# 09 මුල්‍ය9 මෙහෙයුම් සමාලෝචනය

**මුළු ආදායම - 2013 / 2014**




රුපියල් 4,583,594 ක් වූ පෙර වර්ෂයේ ජනනය කරන ලද ආදායමට සාපේක්ෂව ඉඩම් මැනුම් සභාවේ මුළු ආදායම රු. 4,893,381 ක් වේ.

එමෙන්ම අදාළ කාල පරිච්ඡේදය තුළ සභාවේ වියදම රු. 4,425,871 ක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස රු.467,510 ක අතිරික්තයක් පැවතිණ.

2010, 2011, 2012 සහ 2013 වර්ෂවලදී මෙන්ම 2014 වර්ෂය සඳහා ද මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් සපයා නොමැත. 2014 වසර සඳහා ප්‍රාග්ධන වියදම රු. 116,290 ක් විය.

# 10 අරමුදල් සහ මුල්‍ය කළමනාකරණය

ඉඩම් මැනුම් සභාවේ ආදායම ප්‍රධාන වශයෙන්, වාර්ෂික වෘත්තියේ යෙදීමේ බලපත්‍රම ගාස්තු අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පැවැත්වීම සඳහා අය කිරීම් සහ විධිමත් පරීක්ෂණ පැවැත්වීමට දැරූ වියදම වැරදිකරුවන්වූ ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් අයකර ගැනීම් මගින් රැස් කෙරේ.

2014-12-31 වන දිනට රුපියල් 9,950,203/ = ක මුදලක් ලංකා බැංකුවේ ස්ථාවර ගිණුම් වල තැන්පත් කර ඇත.

# 2014 වර්ෂය සඳහා වූ අවසන් ගිණුම්

**ඉඩම් අමාත්‍යාංශය**
**ඉඩම් මැනුම් සභාව**

# 2014 දෙසැම්බර් 31 වන දිනට
# මූල්‍යම තත්වය පිළිබඳ ප්‍ර කාශනය

| විස්තරය | Notes | 2014 | | 2013 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 7,461,850 | | 8,518,410 | |
| ලැබිය යුතු දෑ | 2 | 147,374 | | 189,376 | |
| ආපදා ණය | 3 | 222,407 | | 292,527 | |
| උත්සව අත්තිකාරම් | | 3,000 | 7,834,631 | 2,000 | 9,002,313 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| ස්ථාවර තැන්පතු | 4 | 2,951,147 | | 1,325,249 | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝ පකරණ | 5 | 517,019 | | 523,610 | |
| | | | 3,468,166 | | 1,848,859 |
| **මුළු වත්කම්** | | | 11,302,797 | | 10,851,172 |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| කලින් ලැබී ඇති බලපත්‍රය ගාස්තු | | 2,401,250 | | 2,481,275 | |
| ගෙවිය යුතු දෑ | | 254,723 | | 248,000 | |
| උපචිත වියදම් | 6 | 328,134 | | 279,536 | |
| අවිනිශ්චිත ගිනුම | | 8,819 | 2,992,926 | | |
| **ජංගම නොවන වගකීම්** | | | - | | - |
| **මුළු වගකීම්** | | | 2,992,926 | | 3,008,811 |
| **ශුද්ධ වත්කම්** | | | **8,309,871** | | **7,842,361** |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | | | |
| ප්‍රා ග්ධන සැපයුම | | | | | |
| මහා භාණ්ඩාගාරය | | 1,043,030 | | 1,043,030 | |
| සමුච්චිත අරමුදල | | 6,799,331 | | 5,748,018 | |
| අතිරික්තය/හිඟය | | 467,510 | | 1,051,313 | |
| **මුළු ශුද්ධ වත්කම්/හිමිකම්** | | | **8,309,871** | | **7,842,361** |

ඉහත මූල්‍ය ප්‍රමකාශය 1971 අංක 38 දරන මුදල් පනතට අනුව පිළියෙල කර ඇති බව සහතික කරමු.

ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් ඉහත මූල්‍යම ප්‍ර කාශය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකීම දරණ අතර ඉඩම් මැනුම් සභාව වෙනුවෙන් පහත නිලධාරීන් අත්සන් තබා ඇත.

| | | |
|---|---|---|
| එස්. එම්. පී. පී. සංගක්කාර | රංජිත් මහකුඹුර | පී. එම්. පී. උදයකාන්ත |
| උප සභාපති | ගණකාධිකාරී (අර්ධ කාලීන) | සභාපති |
| ඉඩම් මැනුම් සභාව | ඉඩම් මැනුම් සභාව | ඉඩම් මැනුම් සභාව |

**ඉඩම් අමාත්‍යාංශය**
**ඉඩම් මැනුම් සභාව**

# 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍යම කාර්යසාධනය

| විස්තරය | සටහන | 2014 | | 2013 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **ආදායම්** | | | | | |
| බලපත්‍රය ගාස්තුව | | 2,678,825 | | 2,636,150 | |
| ලියාපදිංචි ගාස්තුව | | 73,500 | | 272,500 | |
| පොලී ආදායම් | | 674,372 | | 1,674,944 | |
| වෙනත් ආදායම් | 7 | 1,466,684 | | | |
| මුළු ආදායම | | | 4,893,381 | | 4,583,544 |
| **වියදම්** | | | | | |
| **<u>පෞද්ගලික පඩිනඩි</u>** | | | | | |
| වැටුප් හා වේතන | 8 | 794,375 | | 808,897 | |
| අතිකාල හා නිවාඩු දින දීමනා | | - | | 11,092 | |
| වෙනත් දීමනා | 9 | 1,730,127 | | 1,065,266 | |
| | | | (2,524,502) | | (1,885,255) |
| **<u>ගමන් වියදම්</u>** | | | | | |
| දේශීය | | | (5,211) | | (6,372) |
| **<u>සැපයුම්</u>** | | | | | |
| ලිපිද්‍රයවිය හා කාර්යාලීය අවශ්‍ය තා | | 123,503 | | 102,656 | |
| වෙනත් | | 72,495 | | 51,830 | |
| | | | (195,998) | | (154,486) |
| **<u>නඩත්තු වියදම්</u>** | | | | | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | | | (4,256) | | (21,280) |
| **<u>සේවා</u>** | | | | | |
| තැපැල් හා සන්නිවේදන | | 134,424 | | 127,957 | |
| විදුලිය හා ජලය | 9 | 78,734 | | 78,734 | |
| වෙනත් | 10 | 1,359,865 | | 1,130,893 | |
| | | | (1,573,023) | | (1,337,584) |
| ක්ෂයවීම | | | (122,881) | | (127,304) |
| මුළු වියදම් | | | (4,425,871) | | (3,532,281) |
| **කාලසීමාවට අදාල අතිරික්තය/ඌනතාව** | | | **467,510** | | **1,051,313** |

එස්. එම්. පී. පී. සංගක්කාර
උප සභාපති
ඉඩම් මැනුම් සභාව

පී. එම්. පී. උදයකාන්ත
සභාපති
ඉඩම් මැනුම් සභාව

**ඉඩම් අමාත්‍යාංශය**
**ඉඩම් මැනුම් සභාව**

# 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | ප්‍රාග්ධන ප්‍රදාන | සමුච්චිත අරමුදල/ඌනතාවය | එකතුව |
|---|---|---|---|
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,043,030 | 6,799,331 | 7,842,361 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/හිඟය | | 467,510 | 467,510 |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,043,030 | 7,266,841 | 8,309,871 |

එස්. එම්. පී. පී. සංගක්කාර
උප සභාපති
ඉඩම් මැනුම් සභාව

පී. එම්. පී. උදයකාන්ත
සභාපති
ඉඩම් මැනුම් සභාව

**ඉඩම් අමාත්‍යාංශය**
**ඉඩම් මැනුම් සභාව**

# 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රමවාහ ප්‍රයකාශය

| විස්තරය | සටහන | 2014 | | 2013 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **<u>මෙහෙයුම් කටයුතුවලින් මුදල්ප්‍ර1වාහ</u>** | | | | | |
| අතිරික්තය/(ඌනතාවය) | | 467,510 | | 1,051,313 | |
| **<u>මුදල් නොවන සංචලනයන්</u>** | | | | | |
| ක්ෂයවීම | | 122,881 | | 127,304 | |
| ස්ථාවර තැන්පතු පොළිය | | (674,372) | | (894,288) | |
| ආපදා ණය (වැඩිවීම)/අඩුවීම | | 70,120 | | 102,524 | |
| උත්සව අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | | (1,000) | | | |
| ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | 42,002 | | (88,013) | |
| ගෙවිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | 6,723 | | (2,250) | |
| කලින් ලැබුණ බලපත්‍ර ගාස්තුව වැඩිවීම/(අඩුවීම) | | (80,025) | | (60,375) | |
| උපචිත වියදමෙහි වැඩිවීම/(අඩුවීම) | | 48,598 | | (16,167) | |
| අවිනිශ්චිත ගිණුමේ වැඩිවීම/(අඩුවීම) | | 8,819 | | | |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍ර(වාහ** | | | 11,256 | | 220,048 |
| **<u>ආයෝජන කටයුතු වලින් ජනනය වූ මුදල් පුවාහ</u>** | | | | | |
| ස්ථාවර තැන්පතු | | (1,625,898) | | (147,250) | |
| ස්ථාවර තැන්පතු පොළිය | | 674,372 | | 894,288 | |
| ස්ථාවර වත්කම් මිළදී ගැනීම | | (116,290) | | (238,053) | |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රමවාහ** | | | (1,067,816) | | 508,985 |
| **<u>මූල්‍ය8 කටයුතු වලින් මුදල් ප්‍රිවාහ</u>** | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ වල දළ වැඩිවීම /(අඩුවීම) | | | (1,056,560) | | 729,033 |
| කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල් සමාන දේ | | | 8,518,410 | | 7,789,377 |
| කාලසීමාව අවසානයේ මුදල් හා මුදල් සමානදේ | 1 | | 7,461,850 | | 8,518,410 |

එස්. එම්. පී. පී. සංගක්කාර
උප සභාපති
ඉඩම් මැනුම් සභාව

පී. එම්. පී. උදයකාන්ත
සභාපති
ඉඩම් මැනුම් සභාව

**ඉඩම් අමාත්‍යාංසශය**

**ඉඩම් මැනුම් සභාව**

# 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්වලට අදාල සටහන්

**1 මුදල් හා මුදල් සමාන දෑ**

| | | | | | |
|---|---|---|---|---|---|
| බැංකුවේ ඇති මුදල | | | | | 462,794 |
| ස්ථාවර තැන්පතු | | | | | |
| අනු අංකය | බැංකුව | කාලය | ගිණුම් අංකය | වටිනාකම | |
| 1 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | මාස 1 | 7256887 | 2,000,000 | |
| 2 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | මාස 2 | 70070797 | 2,231,301 | |
| 3 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | මාස 3 | 74176142 | 1,767,755 | |
| 4 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | මාස 4 | 75333664 | 1,000,000 | |
| | | | | | 6,999,056 |
| | | | | | 7,461,850 |

**2 ලැබිය යුතු දෑ**

| | | |
|---|---|---|
| ලැබිය යුතු පොලී ආදායම | 85,306 | |
| පී. සී. ලියනගේ මයාගෙන් ලැබිය යුතු දඩ මුදල | 22,068 | |
| අත්හිටවූ බලපත්‍ර0 සඳහා ලැබිය යුතු දඩ මුදල | 40,000 | |
| | | 147,374 |

**3 ආපදා ණය**

| | | |
|---|---|---|
| ඩබ්ලිව්. ඒ. එස්. ප්‍රි යදර්ශනි | 36,080 | |
| පී. සී. ලියනගේ | 26,532 | |
| ටී. ජී. ප්‍රනනාන්දු | 159,795 | |
| | | 222,407 |

**4 ස්ථාවර වත්කම්**

| අනු අංකය | බැංකුව | කාලය | ගිණුම් අංකය | වටිනාකම | |
|---|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | වසර 1 | 71352120 | 1,451,147 | |
| 2 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | වසර 1 | 76670842 | 1,500,000 | |
| | | | | | 2,951,147 |

**5 - යන්ත්‍රං හා යන්ත්‍රෝපකරණ**

| අයිතම | 2014-01-01 දිනට ශේෂය රු. | වර්ෂය තුළදී මිළදී ගැනීම රු. | එකතුව රු. | ක්ෂය වීම % | වාර්ෂික ක්ෂයවීම රු. | 2014-12-31 දිනට ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|---|
| යන්ත්‍රෝටපකරණ | 103,559 | 33,365 | 136,924 | 20 | 27,385 | ***109,539*** |
| ගෘහභාණ්ඩ | 149,041 | 14,750 | 163,791 | 10 | 16,379 | ***147,412*** |
| පරිගණක | 175,565 | | 175,565 | 25 | 43,891 | ***131,674*** |
| කාර්යාලීය උපකරණ | 29,643 | 20,400 | 50,043 | 25 | 12,511 | ***37,532*** |
| LSC නාම පුවරුව | 65,802 | | 65,802 | 20 | 13,160 | **52,642** |
| Building and Structure | | 47,775 | 47,775 | 20 | 9,555 | **38,220** |
| එකතුව | 523,610 | **116,290** | **639,900** | | **122,881** | **517,019** |

**6** **උපචිත වියදම්**

| අනු අංකය. | වියදම් | රු. | රු. |
|---|---|---|---|
| 1 | වැටුප් සහ වේතන | 12,750 | |
| 2 | සේවක අර්ථසාධක අරමුදල | 18,502 | |
| 3 | සේවක භාරකාරත්ව අරමුදල | 2,775 | |
| 4 | දුරකතන | 4,107 | |
| 5 | විගණන ගාස්තු | 290,000 | |
| | | | **328,134** |

**7** **වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| තොරතුරු නිකුත් කිරීම සඳහා අයකිරීම් | 68,000 | |
| වැඩමුළු සඳහා පාඨමාලා ගාස්තු | 1,289,000 | |
| අත්හිටවූ බලපත්‍රය සඳහා ලද දඩ මුදල | 60,000 | |
| සේවක ණය පොළිය | 8,290 | |
| විවිධ | 41,394 | |
| | | **1,466,684** |

**8** **වැටුප් හා වේතන**

| | | |
|---|---|---|
| වැටුප් හා වේතන | 641,890 | |
| සේවක අර්ථසාධක අරමුදලේ දායකත්ව මුදල | 121,988 | |
| සේවක භාරකාරත්ව අරමුදලේ දායකත්ව මුදල | 30,497 | |
| | | **794,375** |

**9** **වෙනත් දීමනා**

| | | |
|---|---|---|
| ජීවන වියදම් දීමනා | 298,800 | |
| විශේෂ දීමනා | 119,628 | |
| සභාපතිගේ කාර්ය දීමනා | 299,167 | |
| උප සභාපතිගේ කාර්ය දීමනා | 234,817 | |
| වැඩබලන ලේකම්වරයාගේ කාර්ය දීමනා | 115,590 | |
| ගණකාධිකාරිගේ කාර්ය දීමනා | 68,805 | |
| ඉ.මැ.ස. සාමාජික දීමනා | 481,320 | |
| විගණන කමිටු සාමාජිකයන්ගේ දීමනා | 112,000 | |
| | | **1,730,127** |

**<u>සැපයුම්</u>**

**11** **වෙනත්**

| | | |
|---|---|---|
| විගණන ගාස්තු | 100,000 | |
| දැන්වීම් | 105,452 | |
| ලැමිනේටින් | 18,910 | |
| මුද්‍රණ සහ පොත් බැඳීම් | 70,050 | |
| භාෂා පරිවර්තන | 6,805 | |
| වැඩමුළු වියදම් | 1,038,648 | |
| සේවක පුහුණු පාඨමාලා ගාස්තු | 20,000 | |
| | | **1,359,865** |

# ඉඩම් අමාත්‍යංමශය
# ඉඩම් මැනුම් සභාව

## 2014-12-31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
## පොදු ගිණුම් ප්‍රවතිපත්ති

1. <u>පොදු ගිණුම් ප්‍රනතිපත්</u>ති

1.1. සැකසීමේ පදනම
ශ්‍රී. ලංකා රාජ්‍යද අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට සහ 1971 අංක.38 දරන මුල්‍යස පනතේ විධිවිධානවලට අනුව මූල්‍ය ප්‍රිකාශන සකස්කරනු ලැබේ.

1.2. මුල්‍යව ප්‍ර කාශන උපචිත පදනමින් සකස් කොට ඇත.

1.3. මුල්‍යව ප්‍ර කාශනඉතිහාසික පිරිවැය සම්මතය යටතේ සකස් කෙරේ.

**2.** <u>වත්කම් ඇගයීමේ පදනම</u>

2.1. ස්ථාවර වත්කම් කපාහල අගයට දක්වා ඇත.

2.2. ක්ෂය වීම
ස්ථාවර වත්කම් ක්ෂයවීම හීනවන ශේෂ ක්‍ර මය යටතේ පසුගිය වර්ෂයට අනුකූලව පහත සඳහන් අනුපාතය මත සපයා ඇත.

| <u>වත්කම් වර්ගය</u> | <u>%</u> |
|---|---|
| යන්ත්‍රෝපකරණ | 20 |
| ගෘහ භාණ්ඩ | 10 |
| පරිගණක | 25 |
| කාර්යාලීය උපකරණ | 25 |
| නාම පුවරුව | 20 |
| Building and Structure | 20 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

**AUDITOR GENERAL'S DEPARTMENT**


මගේ අංකය / எனது இல. / My No. LP/F/LSC/01/14/03

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2015 ජූලි [illegible] දින

සභාපති,

ඉඩම් මැනුම් සභාව.

**ඉඩම් මැනුම් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ඉඩම් මැනුම් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනතේ 57(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2015 ජූනි 22 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ඉඩම් මැනුම් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 හි 45 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම වෙන වෙනම ඉදිරිපත් කළ යුතු වුවද වෘත්තීය පාඨමාලා ගාස්තු ආදායම රු. 1,289,000 ක් හා ඊට අදාළ වියදම රු. 1,038,648 ක් වෙනත් ආදායම් හා වෙනත් වියදම් යටතේ දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් දඩ මුදල් ලෙස සමාලෝචිත වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබූ රු. 10,000 ක් වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කිරීම නිසා ආදායම රු. 10,000 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර වෙනත් බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් ගෙවා තිබුණු රු. 10,000 ක දඩ මුදල ලැබිය යුතු දඩ මුදල් ලෙස ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

වෘත්තීය සංවර්ධන පාඨමාලා පැවැත්වීම සම්බන්ධයෙන් වූ ලිපිගොනුව අනුව අයවිය යුතුව තිබුණු පාඨමාලා ගාස්තුව රු. 1,282,000 ක් වූ අතර එය රු. 1,289,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් රු. 7,000 ක් වූ වෙනසට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.4 අවිනිශ්චිත ගිණුම්**

---------------------

සංශෝධිත මූල්‍ය ප්‍රකාශන තුලනය නොවීම හේතුවෙන් රු. 8,819 ක් අවිනිශ්චිත ගිණුමක සටහන් කර ගිණුම් තුලනය කර තිබුණි.

**2.3 ලැබිය යුතු ගිණුම්**

---------------------

සේවයෙන් ඉවත්වී ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 26,325 ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

----------------------------------------------------

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2 ඡේදය අනුව ප්‍රසම්පාදන කටයුත්තක් සඳහා අවම වශයෙන් ආයතන 03 කින් මිල ගණන් කැඳවිය යුතු වුවත් වෘත්තීය පාඨමාලා පැවැත්වීම සඳහා ආයතනයක් තෝරාගෙන ඒ සඳහා පාඨමාලා ගාස්තු ලෙස රු. 336,156 ක්ද ආහාරපාන සඳහා රු. 612,932 ක්ද සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 467,510 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,051,313 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 583,803 ක පිරිහීමක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආයතන හා පරිපාලන වියදම් රු. 916,198 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 4.1 කාර්ය සාධනය

--------------------

මැනුම් පනතෙහි සඳහන් කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 37 (අ) වගන්තිය ප්‍රකාරව කාර්ය සාධන වාර්තාවට අනුව ඉඩම් මැනුම් සභාව වෙත ලැබී සමාලෝචිත වර්ෂය තුළ විසඳීමට තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 106 ක් වූ නමුත් වර්ෂය තුළ විසඳු පැමිණිලි සංඛ්‍යාව 81 ක් විය. එයින් 34 ක් එනම් සියයට 42 ක් උසාවියේ නඩුවක් පවතින පැමිණිලි, මැනුම් සභාවට අදාල නොවන සහ ලියකියවිලි සම්පූර්ණ නොවූ පැමිණිලි බැවින් ප්‍රතික්ෂේප කර තිබුණු නමුත් ඒවා විසඳු පැමිණිලි ලෙස වාර්තාකර තිබුණි. කෙසේවුවද උසාවියක නඩුවක් පවතින පැමිණිලි භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ නිශ්චිත ක්‍රමවේදයක් මැනුම් සභාව අනුගමනය කර නොතිබුණි.

(ආ) ඉඩම් මැනුම් පනතේ (ඈ) සහ (ඊ) වගන්තිය පරිදි 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව වෘත්තීය සංවර්ධන වැඩසටහන් 6 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබුණේ වැඩසටහන් 3 ක් පමණි.

(ඇ) පනතේ 43(1) හා (2) වගන්ති අනුව සභාව විසින් සියළුම ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ නම් ලැයිස්තුවක් ගැසට් පත්‍රයේ පලකළ යුතු වුවද 2014 වර්ෂයේ 1,070 ක් ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරු සිටියද 2014 මාර්තු 28 දින අංක 1856 දරන ගැසට් පත්රයේ පල කර තිබුණේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරු 1,012 දෙනෙකුගේ නම් පමණි.

(ඈ) 37 (ඊ) සහ (උ) වගන්තිය අනුව මිනින්දෝරු වෘත්තිය හා සම්බන්ධ සුදුසුකම් ලැබීමේ විභාග පැවැත්වීම, අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනීම යන කරුණුවලදී සම තත්ත්වයන් ස්ථාපිත කිරීම සඳහා විදේශ රටවල බලධරයන් සමඟ එකඟතාවක් ඇති කරගැනීම වැනි කරුණු අරමුණු කරගෙන තිබූ නමුත් ඒවා ඉටු කරගැනීම සඳහා කිසිදු වැඩපිළිවෙලක් හඳුන්වාදී නොතිබුණි.

(ඉ) ඉඩම් මැනුම් පනතේ 12(1) වගන්තිය අනුව ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකු විසින් සකස් කර සහතික කරන ලද නිශ්චිත වර්ගවල මුල් පිඹුරුවල හෝ සිතියම්වල පිටපත් එම පිඹුරු හෝ සිතියම් සහතික කිරීමෙන් දින තිහක් (30) ඇතුළත සර්වේයර් ජනරාල්වරයා වෙත හෝ ඒ කාර්ය සඳහා ඔහු විසින් නිසි ලෙස බලය ලබාදෙන ලද නිලධරයකු වෙත දත්ත පාදකයක් පිහිටුවීම සඳහා තැන්පත් කළ යුතු වුවද ඒ සම්බන්ධයෙන් 2005 නොවැම්බර් 23 දිනැති අංක 1420/20 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් නියෝග ප්‍රකාශයට පත් කර තිබුණු අතර මැනුම් සභාව විසින් 2006 අප්‍රේල් 20 දිනැති LSC/Cir/02/2006 අංක දරන චක්‍රලේඛයද නිකුත් කර තිබුණු නමුත් 2015 මැයි 15 දක්වාම ඒ සම්බන්ධව ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර විගණන වාර්තාවලද මේ සම්බන්ධව දිගින් දිගටම වාර්තා කර තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

මැනුම් සභාව මගින් සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබූ වෘත්තීය සංවර්ධන පාඨමාලා 03 න් ප්‍රථම වැඩමුළුව සඳහා සාමාජිකයින් 119 දෙනෙකු සහභාගී වී තිබූ අතර ඒ සඳහා රු. 97,141 ක් වැය වී තිබුණද දෙවන හා තෙවන වැඩමුළු සඳහා පිළිවෙලින් 352 දෙනෙකු හා 365 දෙනෙකු සහභාගී වී තිබූ අතර ඒ සඳහා වියදම පිළිවෙලින් රු. 423,459 ක් හා රු. 519,547 ක් වී තිබුණි. ඒ අනුව එක් අයෙක් සඳහා දරා තිබූ පිරිවැය දෙවන වැඩමුළුවේදී සියයට 47 කින් හා තෙවන වැඩමුළුවේදී සියයට 74 කින් වැඩි වී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

----------------------------------------

**5.1 අයවැය ලේඛනමය පාලනය**

------------------------------

වෘත්තීය සංවර්ධන පාඨමාලා පැවැත්වීමේ තථ්‍ය ආදායම රු. 1,289,000 ක් හා තථ්‍ය වියදම රු. 1,038,648 ක් වුවද සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයට අනුව ආදායම රු. 375,000 ක් හා වියදම රු. 140,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබීමෙන් ආදායමේ සියයට 244 ක් හා වියදමේ සියයට 642 ක විචලනයක් පෙන්නුම් කෙරුණි.

### 5.2 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය සහ 2009 ජනවාරි 06 දිනැති අංක ඩීඑමඑස්/ඊ/35/4/391 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව 2009 වර්ෂයේ ජනවාරි මාසයේ සිට සභාවේ ලේකම් තනතුර පුරප්පාඩුව පැවති අතර ඒ සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවා ගන්නා තෙක්, අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති නිලධාරියෙකු වැඩබලන ලේකම්වරයෙකු ලෙස පත් කිරීමට අනුමැතිය දී තිබුණි. ඒ අනුව සභාවේ ලේකම් තනතුර සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු වැඩ බැලීමට පත්කර තිබුණු අතර, ස්ථිර ලේකම් වරයෙකු බඳවා ගන්නා ලෙස 2012 ජූලි 05 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණද එම තනතුර පිරවීමට 2014 මැයි 30 දින දක්වාම කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

### 5.3 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

බලයලත් මිනින්දෝරුවන් විසින් මැනුම්කර සකස් කරන පිඹුරු ඔවුන් භාරයේම පවතින අතර අදාළ බලයලත් මිනින්දෝරුවරයා මියයාම, විදේශගත වීම හා සේවයේ නොයෙදෙන අවස්ථාවලදී පිඹුරු පිටපත් මහජනතාවට ලබාගැනීම දුෂ්කර වන නමුත් ඔවුන් විසින් සකස් කරන ලද පිඹුරුවල පිටපත් දෙපාර්තමේන්තුව වෙත ලබාගැනීම සඳහා ක්‍රමවේදයක් ඇති කිරීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද අතර පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

ඇ) ගිණුම්කරණය

ආ) මූල්‍ය පාලනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)